# ඇමැති වාහනවල මුදල් මැතිවරණයට පෙර ගන්න

## පැෆරල් සංවිධානය

ලසන්ත වීරකුලසූරිය

**මහ** මැතිවරණයට අපේක්ෂකයන් ලෙස ඉදිරිපත්ව සිටින ඇමැතිවරුන්ට නිල වාහන මුදලට යටත්ව භාවිතා කිරීමට අවසර දී ඇති නිසා මැතිවරණයට පෙරම එම මුදල් අය කර ගන්නා ක්‍රමවේදයක් සකසන ලෙස පැෆරල් සංවිධානය ඊයේ (20) මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඇමතිවරයෙකුට අමාත්‍යාංශයේ නිලවාහන තුනක් පාවිච්චි කිරීමට අවසර ලබා දී ඇති අතර සම්බන්ධීකරණ එක් නිලධාරියෙකුටද නිල රථයක් භාවිතා කිරීමට අවසර දී තිබේ. ඒ අනුව අපේක්ෂක ඇමතිවරයාට වාහන 4ක් භාවිත කිරීමට හැකියාව ලැබේ. එම එක් වාහනයක් සඳහා මසකට රුපියල් ලක්ෂයක මුදලක් ගෙවීමටද නියම කර ඇත.

එසේ වුවද එම වාහන මොනවාද, මුදල් අය කර ගන්නේ කෙසේද යන්න සඳහන් නොවන නිසා ඒ සම්බන්ධයෙන් ක්‍රමවේදයක් සකසන ලෙස පැෆරල් සංවිධානය ඉල්ලා තිබේ. ඇමතිවරයා හා සම්බන්ධීකරණ නිලධාරියා භාවිතා කරන රථ 4 මොනවාද කියා ලැයිස්තු ගත කරන ලෙසත්, වාහන වෙනුවෙන් අදාළ මුදල් මැතිවරණයට පෙරම අය කර ගන්නා ලෙසත්, ඔවුන් මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ඉල්ලීමක් කර ඇත.